රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 15/2020

මගේ අංක: MPA/PSD/C6/AT -2021
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2020.09.21

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
කොමිෂන් සභා ලේකම්වරුන්
දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය - 2021**

**01.** රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2020.09.11 දිනැතිව සංශෝධිත, 2018.06.12 දින අනුමත කරන ලද මෙම ස්ථාන මාරු පටිපාටිය ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධරයන් සඳහා ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ අනුව එම ස්ථාන මාරු සිදු කරන ආකාරය පහත දැක්වේ.

**(අ) වාර්ෂික ස්ථාන මාරු කමිටුව මඟින්**

ස්ථාන මාරුවීම් අපේක්ෂා කරන නිලධරයන්ගේ ඉල්ලීම් ඉටු කිරීම සඳහා වාර්ෂික ස්ථාන මාරු කමිටුව ක්‍රියාත්මක කෙරේ. ඒ හැරුණු විට කිසියම් නිලධරයකුගේ සාධාරණ ඉල්ලීමක් ඉටු කිරීමට ඉඩ ලබා ගැනීම සඳහා හෝ අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් පරිපාලනමය කරුණු අනුව කරනු ලබන නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිණිස සේවා ස්ථානයක /ප්‍රදේශයක නියමිත සේවා කාලය සම්පූර්ණ කළ නිලධරයකු වෙනත් සේවා ස්ථානයකට මාරු කිරීමටද වාර්ෂික ස්ථාන මාරු කමිටුවට තීරණ ගත හැක. මෙම මාරුවීම් වර්ෂයේ ආරම්භක වැඩ කරන දිනයේ සිට ක්‍රියාත්මක කළ යුතුය.

**02. වාර්ෂික ස්ථානමාරු සඳහා යටත්වන නිලධරයන්**

2.1. මේ වන විට සේවයේ යෙදී සිටින ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ I/ II/ III ශ්‍රේණියේ නිලධරයන් අතුරින්,

2.1.1. අමාත්‍යාංශයක, දෙපාර්තමේන්තුවක, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක, හෝ වෙනත් රජයේ ආයතනයක උපරිම සේවා කාලය වසර හයක් (06) සම්පූර්ණ කර ඇති නිලධරයන්

2.1.2 එක් දිස්ත්‍රික්කයක් තුළ පිහිටි කුමන හෝ අමාත්‍යාංශයක, දෙපාර්තමේන්තුවක, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක, පළාත් සභාවක, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක, හෝ වෙනත් රජයේ ආයතනයක සේවය කළද එක් දිස්ත්‍රික්කයක් තුළ උපරිම සේවා කාලය වසර දොළහක් (12) සම්පූර්ණ කර ඇති නිලධරයන්

2.1.3 පළාත් සභාවක එක් ආයතනයක උපරිම සේවා කාලය වසර හයක් (06) සම්පූර්ණ කර ඇති නිලධරයන්

2.1.4. පළාත් සභාවට අයත් එක් ආයතනයක හෝ ආයතන කිහිපයක සේවය කළද එක් පළාත් සභාවක් තුළ උපරිම සේවා කාලය වසර දොළහක් (12) සම්පූර්ණ කර ඇති නිලධරයන්

(පළාත් සභාවක එක් ආයතනයක් යන්නට පළාත් ලේකම් කාර්යාලයක්, පළාත් අමාත්‍යාංශයක්, පළාත් දෙපාර්තමේන්තුවක් හෝ පළාත් පාලන ආයතනයක් අයත් වේ.)

2.1.5. ඉහත සඳහන් කර ඇති කාල සීමාවට අඩු කාලයක් එක් සේවා ස්ථානයක සේවය කර ඇති ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ I ශ්‍රේණියේ, II ශ්‍රේණියේ සහ III ශ්‍රේණියේ නිලධරයන් අතුරින් වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම් කර ඇති නිලධරයන්

2.1.6 යම් සේවා ස්ථානයක වසර හයක් (06) ඉක්මවා සේවය කර ඇති, සේවයේ අවශ්‍යතාවය මත ස්ථාන මාරු කිරීමට අපේක්ෂිත නිලධරයන්

2.1.7. විශේෂ අවස්ථාවක් ලෙස සලකා ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ I ශ්‍රේණියට දැනටමත් උසස් කර ඇති නමුදු, තවමත් ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ II හා III ශ්‍රේණියේ තනතුරුවල සේවය කරන නිලධරයන්

2.2 වාර්ෂික ස්ථාන මාරු කමිටු විසින් කටයුතු නොකළ යුතු අවස්ථා

පහත නම් දැක්වෙන ආයතනවලට වාර්ෂික ස්ථාන මාරු කමිටු මඟින් ස්ථාන මාරුවීම් සිදු කරනු නොලැබේ.

i. ජනාධිපති ලේකම් කාර්යාලය
ii. අග්‍රාමාත්‍ය කාර්යාලය
iii. ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලය
iv. සභානායක කාර්යාලය
v. අමාත්‍ය මණ්ඩල කාර්යාලය
vi. විපක්ෂ නායක ලේකම් කාර්යාලය

vii. පහත දැක්වෙන ආයතනවලට වාර්ෂික ස්ථාන මාරු කමිටු මඟින් නිලධාරීන් ස්ථාන මාරු කිරීමේදී එම ආයතනවලින් පිටත ස්ථාන මාරු කරනු ලබන හා එම ආයතනවලට ස්ථාන මාරු කරනු ලබන නිලධාරීන් පිළිබඳව අදාළ ආයතන ප්‍රධානියාගේ එකඟතාවය ලබා ගැනීමට යටත්ව කටයුතු සිදු කරනු ලැබේ.

(අ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව
(ආ) පොලිස් කොමිෂන් සභාව
(ඇ) මැතිවරණ කොමිෂන් සභාව
(ඈ) විගණන සේවා කොමිෂන් සභාව
(ඉ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාව
(ඊ) මුදල් කොමිෂන් සභාව
(උ) ජාතික වැටුප් කොමිෂන් සභාව
(ඌ) සීමා නිර්ණය කොමිෂන් සභාව
(එ) ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව

## 03. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ වාර්ෂික ස්ථාන මාරු කමිටු සංයුතිය

රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් පහත නිලධරයන්ගෙන් සමන්විත ස්ථාන මාරු කමිටුව පත් කරනු ඇත.

(i) අතිරේක ලේකම් (රාජ්‍ය පරිපාලන)
(ii) ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ප්‍රදේශීය පාලන), අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය
(iii) අධ්‍යක්ෂ, ක්‍රමසම්පාදන සේවා අංශය
(iv) ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවා සංගමයේ නියෝජිතයෙක්

## 04. වාර්ෂික ස්ථාන මාරුවීම්වලට විරුද්ධව කරනු ලබන කරුණු දැක්වීම්

4.1 වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටුව

i. ලේකම්, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
ii. වෙනත් අමාත්‍යාංශයක ලේකම්වරයෙකු හෝ රාජ්‍ය අමාත්‍යාංශයක ලේකම්වරයෙකු
iii. අතිරේක ලේකම් (රාජ්‍ය පරිපාලන)

4.2 කරුණු දැක්වීම් ඉදිරිපත් කළ හැකි අවස්ථා

ඉහත සඳහන් ස්ථාන මාරු ක්‍රමය දැඩිව ක්‍රියාත්මක කළ ද සුවිශේෂී හේතුවක් මත, නියමිත කාලය ඉක්මවා යම් නිලධරයකු තම අමාත්‍යාංශයේ හෝ ඒ යටතේ ඇති

දෙපාර්තමේන්තුවක/ආයතනයක තවදුරටත් රඳවා ගැනීමට අමාත්‍යාංශ ලේකම්වරයෙකුට අවශ්‍ය වන්නේ නම්, ඒ සඳහා එම ලේකම්වරයාට තම කරුණු දැක්වීම හා පෞද්ගලික නිර්දේශ සමඟ, ඉහත සඳහන් ස්ථාන මාරු අභියාචනා සමාලෝචන කමිටුව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකිය. එසේ වුවද එම රඳවා ගැනීම් උපරිම වශයෙන් වසරකට සීමා විය යුතුය. තවද ස්ථාන මාරු සම්බන්ධ අභියාචනා සලකා බැලීම සඳහා පහත සඳහන් කරුණු පිළිබඳව පරීක්ෂා කර තීරණ ගනු ලැබේ.

4.2.1. මාරුවීම් ප්‍රතිපත්තියට අනුකූල නොවන පරිදි කරන ලද මාරුවීම්

4.2.2. නිලධරයන්ගේ ඉල්ලීම් ඉටු නොවන අවස්ථා

4.2.3. නිලධරයන්ගේ ඉල්ලීම්වලට පටහැනි ලෙස කරන ලද මාරුවීම්

## 05. ස්ථාන මාරුවීම් වලදී අනුගමනය කරන පොදු ප්‍රතිපත්ති

5.1. මෙම ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේදී සේවා අවශ්‍යතාවයට ප්‍රමුඛතාවය හිමිවේ.

5.2. වාර්ෂික ස්ථාන මාරුවීම් වලදී කාලය ගණනය කරනු ලබනුයේ පෙර වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනටයි. (උදා - 2021 වාර්ෂික ස්ථාන මාරු සඳහා 2020.12.31 දිනය වේ.)

5.3. වාර්ෂික ස්ථාන මාරුවීම් වලදී සේවා කාලය ගණනය කිරීමේදී සේවයේ ආරම්භක දිනය ලෙස සැලකිය යුත්තේ සේවයට වාර්තා කළ වර්ෂයේ ජනවාරි මස පළමු වන දිනයයි. නමුත් නිලධරයාගේ පාලන විෂය ඉක්මවා ගිය කරුණක් හේතුවෙන් සේවයට වාර්තා කළ දිනය පසු දිනයක් වේ නම් මාරු මණ්ඩලය ඒ පිළිබඳව සැලකිල්ල යොමු කරයි.

5.4. සේවා කාලය ගණනය කිරීමේදී එක් දෙපාර්තමේන්තුවක්, අමාත්‍යාංශයක්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක්, පළාත් සභාවක්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක්, හෝ වෙනත් රජයේ ආයතනයක් තුළ අඛණ්ඩව හෝ ඛණ්ඩව කළ සේවා කාලවල එකතුව එහි මුළු සේවා කාලය ලෙස ගණන් ගනු ලැබේ.

5.5. කිසියම් දෙපාර්තමේන්තුවක්, අමාත්‍යාංශයක් හෝ පළාත් සභාවක් යටතේ කුමන දිස්ත්‍රික්කයක සේවය කළද එම සේවා කාලය එම දෙපාර්තමේන්තුවේ, අමාත්‍යාංශයේ හෝ පළාත් සභාවේ සේවා කාලය වශයෙන් ගණන් ගනු ලැබේ. දිස්ත්‍රික් සේවා කාලය ගණන් ගැනීමේදී දිස්ත්‍රික්කය තුළ කුමන කාර්යාලයක සේවය කළද එම කාලවල මුළු එකතුව දිස්ත්‍රික් සේවා කාලය ලෙස ගණන් ගනු ලැබේ.

5.6. යම් සේවා ස්ථානයක සේවය කළ කාලය ගණන් ගැනීමේදී, නිලධරයකුගේ පාලන විෂය ඉක්මවා ගිය හේතුවක් මත, සේවයේ නොසිටි කාලය ගණන් ගනු නොලැබේ. (උදා- ප්‍රසූත නිවාඩු).

5.7. සැමවිටම නිලධරයාගේ ඉල්ලීම අනුව තම කලත්‍රයාගේ සේවා ස්ථානය අයත් ප්‍රදේශයට ආසන්න සේවා ස්ථානයකට මාරුවීම් ලබා දීමට හැකි සෑම උත්සාහයක්ම දරනු ලැබේ.

5.8. නිලධරයාගේ ඉල්ලීම හෝ වෙනත් විශේෂිත කරුණු නැත්නම් මිස සාමාන්‍ය වශයෙන් වයස අවුරුදු 58 ක් ඉක්මවූ නිලධරයන් දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු නොකළ යුතු වුවත්, දිස්ත්‍රික්කය ඇතුළත මාරු කිරීම්වලට යටත්ව ස්ථාන මාරු කරනු ලැබේ.

5.9. විශේෂ කොන්දේසි මත ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයට බඳවාගෙන ඇති නිලධරයන්ගේ ස්ථාන මාරු මෙම පටිපාටිය යටතේ සලකා බැලිය හැක්කේ පත්වීම් ලිපිවල ඇතුළත් කොන්දේසි අනුව අදාළ කාලය ඉකුත් වීමෙන් පසු පමණි. නමුත් සේවා අවශ්‍යතාවය හෝ වෙනත් විශේෂිත හේතු මත අදාළ ප්‍රදේශ ඇතුළත ස්ථාන මාරුවීම්/අනුයුක්ත කිරීම් සිදු කිරීමට බාධාවක් නොමැත.

5.10 ස්ථාන මාරුවීම් ඉල්ලීමේදී (ආකෘති පත්‍ර අංක 01 පරිදි) සහ අභියාචනා ඉදිරිපත් කිරීමේදී (ආකෘති පත්‍ර අංක 04 පරිදි) සලකාබලනුයේ ඒ සඳහා සකස් කර හඳුන්වා දෙනු ලබන ආදර්ශ ආකෘති පත්‍රයට අනුවම සකස් කළ අයදුම්පත් පිළිබඳව පමණි. ස්ථාන මාරු ඉල්ලුම් කරන ලද නිලධාරීන් පිළිබඳ තොරතුරු ආකෘති පත්‍ර 02 මඟින් නිවැරදිව ඉදිරිපත් කළ යුතුය.

5.11 වාර්ෂික ස්ථාන මාරු චක්‍රයක (Cycle) ආකාරයකින් සිදු කරනු ලබන අතර ඉදිරියේදී කරනු ලබන බඳවාගැනීම් හෝ උසස්වීම් වලදී අනුප්‍රාප්තිකයන් ලබා දීම මත ස්ථාන මාරු සිදු කරනු නොලැබේ.

5.12 වාර්ෂික ස්ථාන මාරු කමිටු තීරණ හා සමාලෝචන කමිටු තීරණ වලින් පසු වාර්ෂික ස්ථාන මාරුවීම් වල අවලංගු කිරීම්, සංශෝධනය කිරීම්, කල් දැමීම් පිළිබඳ සියලුම ඉල්ලීම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි ආකෘති පත්‍ර 05A හා 05B න් නියමිත දිනට පෙර රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත එවිය යුතුය.

5.13 වාර්ෂික නොවන ස්ථාන මාරු - රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් මඟින්

වාර්ෂික මාරු කමිටු වලදී හැර ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවා ශාඛාවේ දෛනිකව සිදු කෙරෙන කාර්යයක් වශයෙන් ස්ථාන මාරුවීම් සිදු නොකෙරේ. එහෙත් පරිපාලනමය අවශ්‍යතා, සේවා අවශ්‍යතා සහ විනය හේතු මත රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් ස්ථාන මාරු නියෝග නිකුත් කෙරේ. සාමාන්‍ය

රාජකාරී කටයුතු වලට බාධාවක් නොවන සුහඳ ස්ථාන මාරු ඉල්ලීම්ද නිලධරයන්ගේ හදිසි වූද සානුකම්පිතව සලකා බැලිය යුතු වූ කරුණු අඩංගු ඉල්ලීම් ද අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ නිරීක්ෂණ හා නිර්දේශ ඇතිව, ඉදිරිපත් කරන විට ඒ පිළිබඳව සලකා බලා අවශ්‍ය පියවර ගනු ලැබේ.

5.14 විශේෂ රාජකාරි අවශ්‍යතා හා හදිසි සේවා අවශ්‍යතා මත ස්ථාන මාරු කිරීම

පරිපාලනමය හා සේවා අවශ්‍යතාවලදී නිලධරයකුගේ ඉල්ලීමක් නොමැතිව හා කැමැත්ත විමසීමකින් තොරව ස්ථාන මාරු කිරීමට හෝ තාවකාලිකව අනුයුක්ත කිරීමට රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ට හැකියාව ඇත.

**06. අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්ගේ හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ වගකීම්**

6.1. සියලුම දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශවල වසර 06 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයන්ගේ වාර්තාවක් 5.4 හා 5.5 උප වගන්තිවල දැක්වෙන පරිදි දිස්ත්‍රික්ක අනුව සකස් කර එවිය යුතු වේ.

6.2. සෑම නිලධරයෙකු පිළිබඳවම නිවැරදි හා සම්පූර්ණ තොරතුරු සැපයීමට ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානීන් වග බලා ගත යුතුය. සාවද්‍ය අසම්පූර්ණ තොරතුරු ඇති බව හෙළිදරව් වුවහොත් අදාළ ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානීන්, එම ලැයිස්තු සකස් කළ අය හා එහි නිවැරදි බව පරීක්ෂා කර බලා තහවුරු කරන ලද නිලධරයන් ඒ පිළිබඳව වගකීමට යටත් වේ.

6.3. ස්ථාන මාරු නියෝගයක් ලැබූ සියලුම නිලධරයෝ, නියමිත දිනයේ දි නව රාජකාරි ස්ථානය වෙත වාර්තා කිරීමට බැඳී සිටිති. නිලධාරියෙකු වැඩ බාර ගැනීමෙන් පසු ආකෘති පත්‍ර අංක 06 මඟින් ඒ බව රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත පිටපතක් සහිතව අදාළ සේවා ස්ථානයට දැන්විය යුතුය.

6.4. ස්ථාන මාරු නියෝගයක් ලැබූ සියලුම නිලධරයෝ, නියමිත දිනයේදී නව රාජකාරි ස්ථානය වෙත වාර්තා කිරීමට හැකිවන පරිදි එම නිලධාරීන් නිදහස් කළ යුතුය.

6.5. ස්ථාන මාරුවීම් නියෝග ලැබ සිටින නිලධරයකු එම මාරුවීම ක්‍රියාත්මක වන දිනයෙන් පසු එම ආයතනයේ සේවයෙන් මුදා නොහැරීම ස්ථාන මාරු පටිපාටියට පටහැනිය. ස්ථාන මාරු කමිටුව මඟින් අමාත්‍යාංශයෙන්/දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථාන මාරුවීම් ලබා දී ඇති නිලධරයන් අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන,

නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන සේ ඔවුහු මුදා හැරීමට කටයුතු කළ යුතුය.

6.6 වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් මත නියමිත පරිදි ස්ථාන මාරු නියෝග ලබා ඇති නිලධාරියෙකු නව සේවා ස්ථානය වෙත රාජකාරී සඳහා වාර්තා නොකර සිටින අවස්ථාවකදී එම නිලධාරියා ස්ථාන මාරුව ලබා ඇති දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ප්‍රධානියා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 217 වගන්තිය අනුව සේවය හැර යාමේ නිවේදනය නිකුත් කිරීමට කටයුතු කළ යුතුය.

6.7. එකම අමාත්‍යාංශයක් තුළ දෙපාර්තමේන්තු අතර ස්ථාන මාරු කිරීම

අමාත්‍යාංශයේ හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු අතර අනුයුක්ත කිරීම් සිදු කිරීමේ බලතල අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ට ඇත. එසේ සිදු කළ විටක, ඒ බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් හා විගණකාධිපති වෙත දන්වා එවිය යුතුය.

6.8. එකම දෙපාර්තමේන්තුවක් තුළ ස්ථාන මාරු කිරීම

දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ස්ථාන මාරු කිරීම් පිළිබඳ යෝජනා අදාළ රේඛීය අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුවේ. එම ඉල්ලීම අනුව ස්ථාන මාරු කිරීම අනුමත කිරීම අදාළ අමාත්‍යාංශ ලේකම් විසින් සිදු කළ විටක, ඒ බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්, විගණකාධිපති වෙත දන්වා එවිය යුතුය.

**07.** **ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථානමාරු පටිපාටිය ක්‍රියාත්මක කිරීමේදී අනුගමනය කළ යුතු කාලසටහන**

| | කාර්යය | දිනය |
|---|---|---|
| 01. | වාර්ෂික ස්ථාන මාරු කමිටුව පිහිටු වීම. | 2020 ජුනි මස 01 වන දිනට පෙර |
| 02. | වාර්ෂික ස්ථාන මාරු දැන්වීම් නිකුත් කිරීම. | 2020 සැප්තැම්බර් මස 22 වන දිනට පෙර |
| 03. | සම්පූර්ණ කරන ලද වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර අදාළ බලධාරියා වෙත ඉදිරිපත් කිරීම. | 2020 ඔක්තෝබර් මස 19 වන දිනට පෙර |
| 04. | අදාළ බලධරයා විසින් අයදුම්පත්‍ර ස්ථාන මාරු කමිටුවට භාර දීම. | 2020 නොවැම්බර් මස 17 වන දිනට පෙර |
| 05. | වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ ස්ථාන මාරු යෝජනා අදාළ බලධාරියා වෙත ලිඛිතව භාර දීම | 2020 නොවැම්බර් මස 24 වන දිනට පෙර |
| 06. | යෝජිත වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ දැන්වීම් නිකුත් කිරීම සහ වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු පත් කිරීම. | 2020 දෙසැම්බර් මස 09 වන දිනට පෙර |
| 07. | ස්ථාන මාරු වීම් පිළිබඳ සමාලෝචන කමිටු සඳහා අභියාචන භාර ගැනීමේ අවසන් දිනය. | 2020 දෙසැම්බර් මස 23 වන දිනට පෙර |
| 08. | වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව විසින් යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් වන තම ලිඛිත නිර්දේශ අදාල බලධාරියා වෙත ලිඛිතව භාර දීම. | 2021 ජනවාරි මස 06 වන දිනට පෙර |
| 09. | අවසාන ස්ථාන මාරු වීම් නියෝග නිකුත් කිරීම. | 2021 ජනවාරි මස 21 වන දිනට පෙර |
| 10. | රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම. | 2021 පෙබරවාරි මස 05 වන දිනට පෙර |
| 11. | වාර්ෂික ස්ථාන මාරු බලාත්මක කිරීම. | 2021 මාර්තු මස 01 වන දින සිට |
| 12. | සේවා ස්ථානවලට මුදාහරින ලද, තම සේවා ස්ථානයට වාර්තා කරන ලද නිලධාරීන් පිළිබඳ තොරතුරු රාජ්‍ය සේවා අමාත්‍යාංශය වෙත යොමු කිරීම. | 2021 අප්‍රේල් මස 01ට පෙර |

**08.** **අයදුම්පත් ඉදිරිපත් කිරීම**

8.1 අදාළ ආදර්ශ ආකෘති පත්‍රයට අනුවම සකස් කළ වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් සහ ඊට විරුද්ධව කරනු ලබන කරුණු දැක්වීම් චක්‍රලේඛයෙහි සඳහන් අයදුම්පත් සහ ඊට විරුද්ධව කරනු ලබන කරුණු දැක්වීම් භාර ගන්නා අවසාන දිනට පෙර අදාළ රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ සහිතව රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කළ යුතුය.

8.2 ස්ථාන මාරු වලට යටත් වන නිලධාරින් ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් නොකළේ වුවද එම නිලධාරින් මෙකී චක්‍රලේඛ විධිවිධාන යටතේ වාර්ෂික ස්ථාන මාරු වලට යටත්වේ.

8.3 අදාල ආකෘති පත්‍රවල මෘදු පිටපත් රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

**09. වාර්ෂික ස්ථාන මාරු නියෝග වලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීම පිළිබඳ විස්තර**

9.1 ස්ථාන මාරු කිරීමක් පිළිබඳ ව දෙන ලද නියෝගයකට එරෙහිව කිසියම් රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම්, එම අභියාචනය ආකෘති පත්‍ර 05A සහ 05B ප්‍රකාර ව පමණක් ඉදිරිපත් කළ යුතු වන්නේ ය. තව ද, තමන් විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු තහවුරු කිරීමට අදාළ ලියවිලි වල සහතික කළ පිටපත් එම අභියාචනය සමඟ ඉදිරිපත් කිරීමට ද, ඔහු ක්‍රියා කළ යුතු වන්නේය.

9.2 රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු වන්නේ, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් මඟින් වන අතර, එම අභියාචනයේ පිටපතක් අදාළ පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානියා හා රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත ද යොමු කළ යුතු වන්නේය. තමන් වෙත ඉදිරිපත් වන අභියාචනය අප්‍රමාදවම තම නිරීක්ෂණ සහිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ වගකීම වන්නේය. නිලධරයාට තම කැමැත්ත පරිදි, අභියාචනයේ ප්‍රගමන පිටපතක් සෘජුවම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ හැක්කේය.

9.3 ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක්, එම ස්ථාන මාරු කිරීමේ නියෝගය අදාළ රජයේ නිලධරයා වෙත ලද දින සිට දින 14 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වන්නේය. නියමිත කාලය තුළදී ඉදිරිපත් නොකරන ලද අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නේය.

9.4 කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා නිලධරයෙකු විසින් භාර දෙනු ලබන අභියාචනය අදාළ සියලු ලිපිගොනු, ලිපි ලේඛන හා වාර්තා ආදිය ද, ඊට අදාළ තම නිරීක්ෂණ ද, නිර්දේශද සහිතව එම අභියාචනය ලැබී දින 15 ක් ඇතුළත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට අදාළ දෙපාර්තමේන්තු ප්‍රධාන හා රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා වග බලා ගත

යුතු වන්නේය. එතකුදු වුවත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයෙහි XVIII වැනි පරිච්ඡේදයේ සඳහන් වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධ අභියාචනා අදාළ ලිපිගොනු, ලිපි ලේඛන, වාර්තා, නිරීක්ෂණ හා නිර්දේශ සමඟ 2021 පෙබරවාරි මස 05 වැනි දිනට ප්‍රථම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය.

9.5 මෙම පරිච්ඡේදයෙහි සඳහන් නියමයන්ට අනුගතව තම අභියාචන ඉදිරිපත් කිරීම සෑම රජයේ නිලධරයෙකුගේම වගකීම වන අතර, ඊට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සලකා බලනු නොලබන්නේය.

9.6 ඉහත 9.4 වගන්තියේ සඳහන් ලියවිලි ලැබී දින 15 ක් ඇතුළත, ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව රජයේ නිලධරයෙකු විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා සම්බන්ධයෙන් තීරණයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ඇත්තේය.

9.7 ඉහත සඳහන් පරිදි ඉදිරිපත් කර ඇති අභියාචනයක් සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය සෘජුවම අභියාචක වෙත දන්වනු ලබන අතර, එහි පිටපත් අදාළ පරිදි රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් හා දෙපාර්තමේන්තු ප්‍රධාන වෙත යවනු ලබන්නේය.

9.8 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගයකින් හෝ තීරණයකින් හෝ අතෘප්තියට පත්වන රජයේ නිලධරයෙකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය පනතේ සඳහන් විධිවිධාන වලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය

**ආකෘති පත්‍ර අංක 01**

**ස්ථාන මාරු අයදුම්පත - වර්ෂය 2021**

**ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ I, II සහ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා**

1. පෞද්ගලික තොරතුරු

1.1. නම (පත්වීම් ලිපියේ පරිදි) :..............................................................................................

1.2. නම වෙනස් කර ඇත්නම් එම නම මුලකුරු සමඟ : ..................................................................

1.3. සම්පූර්ණ නම :..............................................................................................................

1.4. ජාතික හැඳුනුම්පත් අංකය : ...........................................................................................

1.5. මුල් පත්වීම් දිනය :.........................................................................................................

1.6. පෞද්ගලික ලිපිනය :........................................................................................................

..........................................................................................................................................

1.7. දුරකථන අංකය :නිවස ............................................ ජංගම : ...........................................

2. වර්තමාන සේවා ස්ථානය

2.1. අමාත්‍යාංශය/පළාත් සභාව : ...........................................................................................

2.2. දෙපාර්තමේන්තුව/ පළාත් අමාත්‍යාංශය : ..........................................................................

2.3. කාර්යාලීය ලිපිනය : .....................................................................................................

2.4. කාර්යාලීය දුරකථන අංකය : ...........................................................................................

3. තනතුර

3.1. වර්තමාන තනතුරු නාමය : ...............................................................................................

3.2. එම තනතුරට පත්වූ දිනය : ...............................................................................................

4. ස්ථාන මාරු ඉල්ලීමට හේතුව : ...........................................................................................

..........................................................................................................................................

5. පූර්ව සේවා ස්ථාන :

| **තනතුර** | **සේවා ස්ථානය** | **කාල සීමාව** |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

6. ස්ථාන මාරු ඉල්ලුම් කරන සේවා ස්ථාන :

| තනතුර | සේවා ස්ථානය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය බවට සහතික කරමි. මා විසින් ස්ථාන මාරු ලැබීමට ඉල්ලා ඇති ඕනෑම සේවා ස්ථානයකට /එම ස්ථානවලට ඉතා ආසන්න ස්ථානයකට ස්ථාන මාරු ලැබීමට කැමැත්ත මින් පළ කරන බවත් එම ඉල්ලීම මත, ලබා දෙන ස්ථාන මාරුව සඳහා නියෝග නිකුත් කළ පසු එම නියෝගය අවලංගු කිරීමට හිමිකමක් නොමැති බවත් පිළිගනිමි.

දිනය : .........................................                .....................................................

අත්සන

ආකෘති පත්‍ර අංක 02

**ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ ස්ථාන මාරුවීම් අයදුම්පත් උපලේඛනය - 2021 වර්ෂය**

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/පළාත් සභාව :...........................................................................................

ප්‍රාදේශීය කාර්යාලය/දිස්ත්‍රික්කය : ..............................................................................................................

| අනු අංකය | නිලධාරියාගේ නම හා ජාතික හැඳුනුම්පත් අංකය | පත්වීම් දිනය හා මාධ්‍යය | තනතුර/ශ්‍රේණිය | පෞද්ගලික ලිපිනය | උපන්දිනය හා 2020.12.31 දිනට වයස | විවාහක/අවිවාහක බව - කලත්‍රයාගේ සේවා ස්ථානය | දරුවන් සංඛ්‍යාව හා පාසල් යන දරුවන් සංඛ්‍යාව | පූර්ව සේවා ස්ථාන හා කාලසීමාව | මාරුවීම් ඉල්ලීමට හේතු | මාරුවීමට කැමති ස්ථානය | මාරු කමිටුවේ තීරණය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

සියලුම නිලධාරීන්ගේ ඉල්ලුම්පත් මෙම ලේඛනයට ඇතුළත් කර ඇති බව සහතික කරමි.

සකස් කළේ නම :...................................... අත්සන :....................................................

පරීක්ෂා කළේ නම :............................... අත්සන :.........................................

.................................................................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

ආකෘති පත්‍ර අංක 03

**එක් දිස්ත්‍රික්කයක, එක් සේවා ස්ථානයක අවුරුදු 06 කට වැඩි කාලයක් හෝ දිස්ත්‍රික්කයක් තුළ ඕනෑම සේවා ස්ථානයක අවුරුදු 12 කට වැඩි කාලයක් සේවය කර ඇති සියලුම නිලධාරීන්ගේ විස්තර මෙහි අනිවාර්යයෙන්ම ඇතුළත් විය යුතු බව සලකන්න. (2020.12.31 දිනට)**

**(වැඩිම සේවා කාලයක් ඇති නිලධාරීන්ගේ නම් මුලින්ම ඇතුළත් විය යුතු බව සලකන්න.)**

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/පළාත් සභාව :..........................................................................................................................................................

ප්‍රාදේශීය කාර්යාලය/දිස්ත්‍රික්කය : .........................................................................................................................................................................

| අනු අංකය | **නිලධාරියාගේ නම (මයා/මිය/මෙය යන්න සඳහන් කරන්න)** | **පත්වීම් දිනය** | **ජාතික හැඳුනුම්පත් අංකය** | **තනතුර/ ශ්‍රේණිය හා මාධ්‍යය** | උපන්දිනය හා **2020.12.31.** දිනට වයස | වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය **2020.12.31** දිනට | **විවාහක/ අවිවාහක බව - කලත්‍රයාගේ සේවා ස්ථානය** | **පාසල් යන ළමයින් පිළිබඳ විස්තර** | **දැනට පදිංචි ප්‍රදේශය හා ලිපිනය** | **මුල් පත්වීමේ සිට සේවා ස්ථාන හා කාලසීමාවන්** | **වාර්ෂික ස්ථානමාරු සඳහා අයදුම්කර නොමැති නම් ස්ථාන මාරුවක් ලැබුණහොත් සේවය කිරීමට කැමති ස්ථාන 03 ක්** |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

සියලුම නිලධාරීන්ගේ ඉල්ලුම්පත් මෙම ලේඛනයට ඇතුළත් කර ඇති බව සහතික කරමි.

සකස් කළේ නම :......................................  අත්සන :.....................................................

පරීක්ෂා කළේ නම :........................................  අත්සන :.....................................................

දිනය :

...................................................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

**ආකෘති පත්‍ර අංක 04**

**ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ ස්ථාන මාරුවීම් - අභියාචනා පිළිබඳ ඉල්ලුම් පත්‍රය - වර්ෂය 2021**

| |
|---|
| ස්ථානමාරුවීම් ලේඛනයේ අනන්‍යතා අංකය : |
| ............................................... |

අමාත්‍යාංශය :...............................................

දෙපාර්තමේන්තුව : ...........................................

(අ) නිලධාරියා විසින් සම්පූර්ණ කළ යුතුය.

1. I නිලධාරියාගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) : ...............................................................
   ..................................................................................................................................මයා/මිය/මෙනවිය
   II. ස්ථිර ලිපිනය : ................................................................................................................
   ..............................................................................................................................................

   III. පදිංචි ස්ථානයේ ලිපිනය : ......................................................................................................
   ..............................................................................................................................................
   Iv.2021 වර්ෂයේ පදිංචි ස්ථානය වෙනස් වන්නේ නම් නව පදිංචි ස්ථානයේ ලිපිනය :
   ..............................................................................................................................................
   ..............................................................................................................................................
2. ස්ථාන මාරු කරන ලද සේවා ස්ථානය : ..................................................................................
3. තනතුර හා ශ්‍රේණිය : ..................................................................................................................
   3.1. සේවයට ඇතුළත් වූ දිනය : .............................................................................................
   3.2. ශ්‍රේණියට ඇතුළත් වූ දිනය : ..........................................................................................
4. උපන් දිනය : ................................................................................................................................
   2020.12.31 දිනට වයස අවු. : ...............................................................................................
5. සේවා විස්තර පත් වූ දිනය සේවා ස්ථානය සිට / දක්වා

| සේවා විස්තර | පත් වූ දිනය | සේවා ස්ථානය සිට / දක්වා |
|---|---|---|
| ................................ | .................................... | ............................................... |
| ................................ | .................................... | ............................................... |
| ................................ | .................................... | ............................................... |

6. මා ඉල්ලා සිටිනුයේ දී ඇති ස්ථාන මාරුවීම අවලංගු කිරීමටය / සංශෝධනය කිරීමටය.

7. අභියාචනා කිරීමට හේතු (පසු පිටෙහි සඳහන් කරන්න)
8. ස්ථාන මාරුව සංශෝධනය කළ යුතු/ලබාදිය යුතු සේවා ස්ථානය :
   අමාත්‍යාංශය : ..........................................................................................................................
   දෙපාර්තමේන්තුව : ....................................................................................................................

දිනය : .................................................. ..............................................................

නිලධාරියාගේ අත්සන

(ආ) දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිරීක්ෂණ :

I. කාර්යාල තොරතුරු අනුව ඉහත විස්තර නිවැරදි වේ .

II. මෙම ස්ථාන මාරුව අවලංගු කිරීම/ සංශෝධනය කිරීම සම්බන්ධයෙන් වන කරුණු දැක්වීම හා නිර්දේශය:..........................................................................................................................
..............................................................................................................................................
..............................................................................................................................................

දිනය : ........................................ ..............................................................................

අමාත්‍යාංශ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

(අනවශ්‍ය වචන කපා හරින්න. සම්පූර්ණ තොරතුරු ඇතුළත් නොකළ අයදුම්පත් අභියාචනා මණ්ඩලය විසින් සළකා බලනු නොලැබේ. වැඩි විස්තර ඇත්නම් පසුපිට සඳහන් කරන්න

**<u>ආකෘති පත්‍ර අංක : 5A</u>**

## <u>වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ අභියාචනා</u>

**<u>ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ  වාර්ෂික ස්ථාන මාරු තීරණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම - වර්ෂය 2021</u>**

**<u>අභියාචක පිළිබඳ තොරතුරු</u>**

අ. පෞද්ගලික තොරතුරු

| | | | |
|---|---|---|---|
| 01. මුලකුරු සමඟ නම | | | |
| 02. තනතුරු හා පන්තිය | | | |
| 03. උපන් දිනය<br>YYYY/MM/DD | 04. වයස :-<br>(2020.12.31 දිනට) | 05. ජාතික හැඳුනුම්පත් අංකය | 06. ස්ත්‍රී / පුරුෂ භාවය |
| 07. ස්ථිර ලිපිනය :-<br><br>ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :-<br><br>දිස්ත්‍රික්කය :- | | 08. තාවකාලික ලිපිනය :- | 09. දුරකථන අංකය :-<br><br>කාර්යාලය :-<br><br>පෞද්ගලික :- |
| 10. විවාහක / අවිවාහක බව :- | 11. කලත්‍රයාගේ නම :- | 12. කලත්‍රයාගේ රැකියාව හා සේවා ස්ථානය :- | |
| 13. දරුවන් ගණන :- | 14. ඔවුන්ගේ වයස :- | 15. ඉගෙනුම ලබන පාසැල් :- | |

ආ. සේවා තොරතුරු

| | |
|---|---|
| 16. තනතුරට පත් වූ දිනය :- | |
| 17. වර්තමාන සේවා ස්ථානය | 18. සේවා ස්ථානය පිහිටි නගරය :- |
| 19. වර්තමාන සේවා ස්ථානයට වාර්තා කළ දිනය :- | 20. වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය<br>(2020.12.31 දිනට)<br><br>අවුරුදු............මාස............දින......... |
| 21. ප්‍රතිලාභ ලබන (ප්‍රියමනාප) සේවා ස්ථානයක / ස්ථානවල සේවය කර තිබේද? | |

| 22. රජයේ සේවයේ පූර්ව සේවා ස්ථාන | සේවා ස්ථාන | | ප්‍රියමනාප සේවා ස්ථානයකි /ප්‍රියමනාප නොවන සේවා ස්ථානයකි | සේවා කාලය | |
|---|---|---|---|---|---|
| | 1 | | | සිට | දක්වා |
| | 2 | | | | |
| | 3 | | | | |
| | 4 | | | | |
| | 5 | | | | |
| | 6 | | | | |

ඇ. ස්ථාන මාරු ඉල්ලීම් පිළිබඳ තොරතුරු (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

| 23. වාර්ෂික ස්ථාන මාරු අයදුම් කර | | ස්ථාන මාරු අයදුම් කර ඇති සේවා ස්ථාන | |
|---|---|---|---|
| ඇත | නැත | 1 | |
| | | 2 | |
| | | 3 | |
| | | 4 | |
| | | 5 | |
| ස්ථාන මාරු ලැබී තිබේ නම් එම සේවා ස්ථානය :- | | | |
| ස්ථාන මාරු ලැබී ඇති සේවා ස්ථානයට , නිලධාරියා ස්ථිර පදිංචි ස්ථානයේ සිට ඇති දුර (කි.මී) :-<br><br>ස්ථාන මාරු චක්‍රය සමන්විත වන නිලධාරීන් ගණන : - | | | |

| 24. ස්ථාන මාරු සමාලෝචන කමිටුවට අයදුම් කර | ඇත | |
|---|---|---|
| | නැත | |

25. නිලධරයා මීට පෙර වර්ෂවලදී වාර්ෂික ස්ථාන මාරු සඳහා ඉල්ලුම් කර තිබේද?

ස්ථාන මාරු ඉල්ලුම් කර ඇත්නම්, ස්ථාන මාරු ඉල්ලුම් කර ඇති වර්ෂ හා ඉල්ලුම් කර ඇති සේවා ස්ථාන

| | ඉල්ලුම් කළ වර්ෂය | ඉල්ලුම් කරන ලද සේවා ස්ථාන |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

| |
|---|
| 26. ඉහත අංක 26 පරිදි ඉල්ලුම් කරන ලද වාර්ෂික ස්ථාන මාරු ඉල්ලීම් සම්බන්ධයෙන් ලැබී ඇති තීරණ :-<br>(ස්ථාන මාරුවක් ලැබී නොමැති නම් ඒ බවද සඳහන් කරන්න) |

ඈ. සමාලෝචන කමිටුව වෙත කරන ලද ඉල්ලීම් පිළිබඳ තොරතුරු :-

| 27. සමාලෝචන කමිටුව වෙත කරන ලද ඉල්ලීම :- | | | |
|---|---|---|---|
| ස්ථාන මාරුව අවලංගු කිරීම | | ස්ථාන මාරුව සංශෝධනය කිරීමට ඉල්ලුම් කළේ නම් එසේ ඉල්ලුම් කළ සේවා ස්ථාන | |
| ස්ථාන මාරුව සංශෝධනය කිරීම | | 1 | |
| නව ස්ථාන මාරුවක් ලබා ගැනීම | | 2 | |
| | | 3 | |

| |
|---|
| 28. ස්ථාන මාරු සමාලෝචන කමිටු තීරණය :- |

ඉ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනය පිළිබඳ තොරතුරු :-

29. ස්ථාන මාරු සමාලෝචන කමිටු තීරණයට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හේතු :-

1. ..............................................................................................................................................
2. ..............................................................................................................................................
3. ..............................................................................................................................................

30. ඉහත හේතු සනාථ කිරීමට අදාළ ලිඛිත සාධකවල සහතික කළ පිටපත් පහත දැක්වෙන ඇමුණුම් වශයෙන් යා කර ඇත. :-

ඇමුණුම 1 ..............................................................................................................................................

ඇමුණුම 2 ..............................................................................................................................................

ඇමුණුම 3..............................................................................................................................................

31. ඉල්ලා සිටිනු ලබන සහන :-

1. ..............................................................................................................................................
2. ..............................................................................................................................................
3. ..............................................................................................................................................

ඉහත දක්වා ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

| | |
|---|---|
| ................................. | ................................... |
| දිනය | අත්සන |

ඊ. අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ

නිලධාරියා / නිලධාරිනිය විසින් ඉදිරිපත් කර ඇති ඉහත සඳහන් තොරතුරු ඔහුගේ / ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවරදි බව සහතික කරමි. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ 2021 වාර්ෂික ස්ථාන මාරු තීරණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන අභියාචනය නිර්දේශ කරමි. පහත සඳහන් හේතු මත නිර්දේශ නොකරමි.

I. ....................................................................................................................................................

II. ....................................................................................................................................................

III. ....................................................................................................................................................

................................. ...................................

දිනය අත්සන

උ. ස්ථාන මාරු බලධරයාගේ නිර්දේශ :-

I. ස්ථාන මාරු චක්‍රය සම්බන්ධ වන නිලධාරීන් ගණන ...............................................................................

II. අභියාචනය පිළිබඳ නිර්දේශය :

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

................................. ...................................

දිනය අත්සන

- **ආකෘති අංක 05B**

**වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ අභියාචනා**

**ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ වාර්ෂික ස්ථාන මාරු තීරණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම - වර්ෂය 2021**

**අනුප්‍රාප්තික නිලධාරියා පිළිබඳ තොරතුරු**

I. අභියාචක නිලධාරියාගේ නම හා තනතුර :
   ..........................................................................................................................................................
II. අභියාචක නිලධරයාට අදාළ අනුප්‍රාප්තික නිලධාරියා පිළිබඳ තොරතුරු

අ. පෞද්ගලික තොරතුරු

| | | | |
|---|---|---|---|
| 01. මුලකුරු සමඟ නම | | | |
| 02. තනතුරු හා පන්තිය | | | |
| 03. උපන් දිනය<br>YYYY/MM/DD | 04. වයස :-<br>(2020.12.31 දිනට) | 05. ජාතික හැඳුනුම්පත් අංකය | 06. ස්ත්‍රී / පුරුෂ භාවය |
| 07. ස්ථිර ලිපිනය :- | 08. තාවකාලික ලිපිනය :- | 09. දුරකථන අංකය :-<br>කාර්යාලය :-<br>පෞද්ගලික :- | |
| 10. විවාහක / අවිවාහක බව :- | 11. කලත්‍රයාගේ නම :- | 12. කලත්‍රයාගේ රැකියාව හා සේවා ස්ථානය :- | |
| 13. දරුවන් ගණන :- | 14. ඔවුන්ගේ වයස :- | 15. ඉගෙනුම ලබන පාසැල් :- | |

ආ. සේවා තොරතුරු

| | |
|---|---|
| 16. තනතුරට පත් වූ දිනය :- | |
| 17. වර්තමාන සේවා ස්ථානය | 18. සේවා ස්ථානය පිහිටි නගරය :- |
| 19. වර්තමාන සේවා ස්ථානයට වාර්තා කළ දිනය :- | 20. වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය<br>(2020.12.31 දිනට)<br>අවුරුදු............මාස............දින |
| 21. ප්‍රතිලාභ ලබන (ප්‍රියමනාප) සේවා ස්ථානයක / ස්ථානවල සේවය කර තිබේද? | |

| 22. රජයේ සේවයේ පූර්ව සේවා ස්ථාන | සේවා ස්ථාන | | ප්‍රියමනාප සේවා ස්ථානයකි /ප්‍රියමනාප නොවන සේවා ස්ථානයකි | සේවා කාලය | |
|---|---|---|---|---|---|
| | 1 | | | සිට | දක්වා |
| | 2 | | | | |
| | 3 | | | | |
| | 4 | | | | |
| | 5 | | | | |

ඇ. ස්ථාන මාරු ඉල්ලීම් පිළිබඳ තොරතුරු (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

| 23. වාර්ෂික ස්ථාන මාරු අයදුම් කර | | ස්ථාන මාරු සංශෝධනය කිරීමට ඉල්ලුම් කළේ නම් ඉල්ලුම් කළ සේවා ස්ථාන | |
|---|---|---|---|
| ඇත | නැත | 1 | |
| | | 2 | |
| | | 3 | |
| | | 4 | |
| | | 5 | |

ස්ථාන මාරු ලැබී තිබේ නම් එම සේවා ස්ථානය :-

ස්ථාන මාරු ලැබී ඇති සේවා ස්ථානයට, නිලධරයා පදිංචි ස්ථානයේ සිට ඇති දුර (කි.මී.) :-

ස්ථාන මාරු චක්‍රය සමන්විත නිලධාරීන් ගණන :- ..................................

24. නිලධරයා මීට පෙර වර්ෂවලදී වාර්ෂික ස්ථාන මාරු සඳහා ඉල්ලුම් කර තිබේද?

ස්ථාන මාරු ඉල්ලුම් කර ඇත්නම්, ස්ථාන මාරු ඉල්ලුම් කර ඇති වර්ෂ හා ඉල්ලුම් කර ඇති සේවා ස්ථාන

| | ඉල්ලුම් කළ වර්ෂය | ඉල්ලුම් කරන ලද සේවා ස්ථාන |
|---|---|---|
| | | |
| | | |
| | | |

| |
|---|
| 25. ඉහත අංක 24 පරිදි ඉල්ලුම් කරන ලද වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් ලැබී ඇති තීරණ :- |

ඈ. සමාලෝචන කමිටුව වෙත කරන ලද ඉල්ලීම් පිළිබඳ තොරතුරු : -

| | | |
|---|---|---|
| 26. ස්ථාන මාරු සමාලෝචන කමිටුවට අයදුම් කර | ඇත | |
| | නැත | |

| | | |
|---|---|---|
| 27. සමාලෝචන කමිටුව වෙත කරන ලද ඉල්ලීම:- | | |
| ස්ථාන මාරුව අවලංගු කිරීම | | ස්ථාන මාරුව සංශෝධනය කිරීමට ඉල්ලුම් කළේ නම් එසේ කළ සේවා ස්ථාන |
| සංශෝධනය කිරීම | | 1 |
| නව ස්ථාන මාරුවක් ලබා ගැනීම | | 2 |
| | | 3 |

| |
|---|
| 28. ස්ථාන මාරු සමාලෝචන කමිටු තීරණය :- |

ඉ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා කිරීම පිළිබඳ තොරතුරු: -

| |
|---|
| 29. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කර තිබේ ද / නැද්ද යන්න :- |

30. අභියාචකගේ ඉල්ලීම ඉටුකළහොත් අනුප්‍රාප්තික නිලධරයාට අගතියක් නොවන පරිදි ස්ථාන මාරු චක්‍රය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ලේකම්, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ නිර්දේශය :-

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

................................ ..................................

දිනය අත්සන